# ප්‍රසූතිකාධාර ආඥා පනත

**කම්කරු දෙපාර්තමේන්තුව**

# ප්‍රසූතිකාධාර ආඥා පනත

140 වන අධිකාරිය

කම්කරු ස්ත්‍රීන්ට සූතිකාධාර ගෙවීම සඳහාත්, ඔවුන්ගේ ප්‍රසව කාලයට පෙර සහ පසුව ඔවුන් සේවයෙහි යෙදීම සම්බන්ධයෙන් ඇති වන වෙනත් කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීමට සැකසුණු පනතයි.

ආඥා පනත්
1939 අංක 32
1946 අංක 35
පනත්
1952 අංක 26
1958 අංක 06
1962 අංක 24
1966 අංක 01
1978 අංක 13
1981 අංක 52

( ජූලි 28. 1941 )

1. මෙම පනත 1939 අංක 32 දරණ සූතිකාධාර පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය

2. කිසිම සේවායෝජකයෙකු විසින් කම්කරු ස්ත්‍රියකගේ ප්‍රසව කාලයට ඉක්බිතිව සති හතරක කාලය තුළදී කිසිම අවස්ථාවක දැනුවත්ව ඇයට සේවයෙහි නොයෙදිය යුතුය.

කම්කරු ස්ත්‍රියක් ඇයගේ ප්‍රසවයට ඉක්බිති සති හතරක කාලය තුල සේවයේ නොයෙදිය යතය.

3. යම් ස්ත්‍රියකට සූතිකාධාර ගෙවනු ලැබීමට හිමිකම් ඇත්තේ යම් කාල සීමාවකටද ඒ කාල සීමාව පහත දැක්වෙන පරිදි විය යුතුය.

සූතිකාධාර ගෙවිය යුත්තේ කිනම් කාල සීමාවකටද යන වග.

(අ) ප්‍රසූතියෙන් සජීවී දරුවෙකු බිහිවුවහොත් සහ ඒ ස්ත්‍රියට ඒ ප්‍රසූති දිනය වන විට , දරුවෙකු නොමැති නම් හෝ එක් දරුවෙකු පමණක් සිටී නම් ප්‍රසූති දිනයද ඇතුළුව ඒ දිනය දක්වා සති දෙකක් ද ඒ දිනයෙන් ඉක්බිතිව සති දහයක්ද යන ආකාරයෙන් සති දොළහක්,

1981 අංක 52
1985 අංක 43

(ආ) (1) ප්‍රසූතියෙන් සජීවී දරුවෙකු බිහිවුවහොත් සහ ඒ ස්ත්‍රියට ඒ ප්‍රසූති දිනය වන විට දරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටී නම් හෝ,
(11) ප්‍රසූතියෙන් සජීවී දරුවෙකු බිහි නොවුවහොත් ප්‍රසූති දිනය ද ඇතුළුව ඒ දිනය දක්වා සති දෙකක් සහ ඒ දිනයෙන් ඉක්බිතිවම සති හතරක් යන ආකාරයෙන් සති හයක්,

එසේ වුවද, (අ) ඡේදයෙහි සහ (ආ) ඡේදයෙහි සඳහන් ඉහත කී සති දෙකේ කාල සීමාව ඇතුළත යම් දින ගණනක් ඒ ස්ත්‍රිය , ස්වකීය සේවා නියුක්තියෙහි සේවය කර ඇති අවස්ථාවක, ප්‍රසූතියෙන් පසුව අවස්ථාවෝචිත පරිදි ඉහත කී සති දහයේ හෝ සති හතරේ කාල සීමාව අවසන් වීමෙන් ඉක්බිතිව එළඹෙන දිනයෙන් ආරම්භව ඒ දින ගණන සඳහා සූතිකාධාර ගෙවනු ලැබීමට ඇයට හිමිකම් තිබිය යුතුය.

(2). (1) වන උප වගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් සති දොළහේ කාල සීමාව තුළදී හෝ (ආ) ඡේදයේ සඳහන් සති හයේ කාල සීමාව තුළදී හෝ යම් ස්ත්‍රියක මිය ගියහොත්, සූතිකාධාර ගෙවිය යුත්තේ ඇයගේ මරණය සිදුවූ දිනය ද ඇතුළුව ඒ දිනය තෙක් පමණකි.

4. වගන්තිය ඉවත් කරන ලදී. 1978 අංක 13

5. (1) (3) වන හා (4) වන උප වගන්ති වල විධිවිධාන වලට යටත්ව ගැහැණු කම්කරුවෙකුගේ සේවා යෝජක විසින් ඒ කම්කරුවෙකුට,

සේවායෝජකයාගේ වගකීම හා ප්‍රසූතිකාධාර ගෙවීමේ ප්‍රමාණය

(අ) ප්‍රසූතියෙන් සජීවී දරුවෙකු බිහිවුවහොත් සහ ඒ කම්කරු ස්ත්‍රියට ඒ ප්‍රසූති දිනය වන විට දරුවකු නොමැති නම් හෝ එක් දරුවකු පමණක් සිටී නම් , ප්‍රසූතියට පෙරාතුවම වූ සති දෙකක කාල සීමාව සහ ඇයගේ ප්‍රසූති දිනයෙන් ඉක්බිතිවම එළඹෙන සති දහයක කාල සීමාව යන සම්පූර්ණ කාල සීමාව සඳහා ද, සහ

1946 අංක 35
1981 අංක 52
1985 අංක 43

(ආ) (1) ප්‍රසූතියෙන් සජීවී දරුවෙකු බිහිවුවහොත් සහ ඒ කම්කරු ස්ත්‍රියට ඒ ප්‍රසූතිදිනය වන විට දරුවන් දෙදෙනෙකු හෝ දරුවන් දෙදෙනෙකුට වැඩි සංඛ්‍යාවක් සිටී නම් හෝ,
(11)ප්‍රසූතියෙන් සජීවී දරුවෙකු බිහි නොවුවහොත් ප්‍රසූතියට පෙරාතුවම සති දෙකක කාල සීමාව සහ ප්‍රසූතියෙන් ඉක්බිතිව සති හතරක කාල සීමාව සහ සම්පූර්ණ කාල සීමාව සඳහා ද, නියමිත අනු ප්‍රමාණයක් අනුව සූතිකාධාර ගෙවිය යුතුය.

එසේ වුවද, එවැනි කම්කරුවෙක් ප්‍රසූත දිනයට පෙරාතුවම වූ (අ) ඡේදයේ සහ (ආ) ඡේදයේ සඳහන් ඉහත කී සති දෙකේ කාලසීමාව ඇතුළත ඇයගේ සේවා නියුක්තියෙහි යම් දිනයක් තුළ සේවය කර ඇති අවස්ථාවක ඇයට ඒ දිනය සඳහා ද අදාළ කාලසීමාවෙන් ඒ දිනයට කලින් වූ කාලසීමාවේ කොටස සඳහා ද ඇයගේ දරු ප්‍රසූතියෙන් ඉක්බිතිව, සූතිකාධාර ලැබීමට හිමිකම් තිබිය යුතුය.

(2) උප වගන්තිය ඉවත් කරන ලදී. 1981 අංක 52

(3) ස්වකීය වත්තේ සේවයේ යොදවා ඇති ගැහැණු කම්කරුවෝ සඳහා නියම කළ හැකි පරිදි වෛකල්පිත සූතිකාධාර සැපයීමට කටයුතු සලස්වා ඇති සේව්‍යයකුට ඒ බව සඳහන් ලිඛිත සහතිකයක් කම්කරු කොමසාරිස් වරයා විසින් නිකුත් කොට ඇති විට (1) වන උප වගන්තියේ සඳහන් සූතිකාධාර වෙනුවට එම සේව්‍යයා විසින් පහත සඳහන් වෛකල්පිත සූතිකාධාර සැපයිය යුත්තේ,

(අ) එම වත්තෙහි පදිංචිව සිටින සෑම කම්කරු ස්ත්‍රියක හා,

(ආ) වත්තෙහි පදිංචිව නොසිටින නමුදු ප්‍රසව කාලයට පළමු එම අන්දමේ ප්‍රසූතිකාධාර ලැබීමට කැමති බව දන්වා සේවා යෝජකයාට නියමිත ප්‍රකාරයට දැන්වීමක් කළ සෑම කම්කරු ස්ත්‍රියක් ද වේ.

(4) කිනම් ගැහැණු කම්කරුවෙක් හෝ තම සේව්‍යයාගෙන් (3) වන උප වගන්තියේ සඳහන් වෛකල්පිත සූතිකාධාර ලබාගැනීම ප්‍රතික්ෂේප කළ විට (1) වෙනි වගන්තියේ සඳහන් සූතිකාධාර ලැබීමටද අයිතිවාසිකම් නැත්තේය. 1962 අංක 24

(5) මෙම උප වගන්තිය යටතේ ගැහැණු කම්කරුවන්ට වෛකල්පිත ප්‍රසූත පහසුකම් සැපයීම යම් සේව්‍යයෙක් නවතා දමා ඇති බවට කම්කරු කොමසාරිස් වරයා තමාට උචිත පරිදි පරීක්ෂණයකින් පසුව සෑහීමකට පත් වුවහොත් කොමසාරිස් වරයා විසින් (3) වෙනි උප වගන්තිය යටතේ නියුක්ත කර ඇති සහතිකය ඔහු විසින් අවලංගු කිරීමට ඉඩ ඇත.

(6) (5) වෙනි උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාර (3) වෙනි උප වගන්තිය යටතේ සේවා යෝජකයෙකු වෙත නිකුත් කරන ලද සහතික පත්‍රයක් අවලංගු කළ කල්හි සේවා යෝජකයා විසින් (1) වෙනි උප 1962 අංක 24

වගන්තියෙහි සඳහන් ප්‍රසූතිකාධාර ඔහුගේ වත්තෙහි සේවය කරන කම්කරු ස්ත්‍රීන්ට ගෙවිය යුතුය.

(7) ඉහත (3) වන උප වගන්තියෙහි සඳහන් වෛකල්පිත ප්‍රසූතිකාධාර කොටසක් මුදලින් ගෙවන අවස්ථාවල එම මුදල හෝ එම මුදල් වල එකතුව (1) වන උප වගන්තියේ සූතිකාධාරයෙන් හතෙන් හතරක ප්‍රමාණය ඉක්මවන අයුරින් ඇමතිවරයා නියම නොකළ යුතුය.

(8) මෙම වගන්තිය යටතේ මුදල් ගෙවිය යුතු කාලය ගණනය කිරීමේදී ඉරිදා හා නිවාඩු දිනයන් ගණන් ගත යුතුවේ. ඉරිදා හා නිවාඩු දිනයන්

6. මෙම පනතෙහි සඳහන් ප්‍රසූතිකාධාර හෝ අන්‍ය ප්‍රසූතිකාධාර හෝ එකම ප්‍රසව කාලය සම්බන්ධයෙන් සේවා යෝජකයින් එක්කෙනෙකුට වැඩි ගණනකින් ඉ ල්ලීමට කිසිම ස්ත්‍රියකට 4 වෙනි හෝ 5 වෙනි වගන්තිවල සඳහන් විධිවිධාන කිසිවකින් බලය ලැබී තිබෙන ලෙස නොසැලකිය යුතුය.

7. (1) ඇයගේ ප්‍රසව කාලයට පෙර දැනුම් දෙන දින සිට මාසයක් ඇතුළතදී ඇය ප්‍රසව අවස්ථාවට එළඹීමට බලාපොරොත්තු වන බව දන්වන දැන්වීමක් සේවා යෝජකයාට දීමට කම්කරු ස්ත්‍රියකට පුළුවන.

(2) දරු ප්‍රසූතියක් සිදුකල ගැහැණු කම්කරුවෙකු විසින් ඒ දරු ප්‍රසූතිය සිදුවී සතියක් ඇතුළත ඒ ප්‍රසූතිය සිදුවූ දිනය ඇයගේ සේවා යෝජකයාට දැනුම් දිය යුතු අතර , ඇයට සේවා නියුක්තියෙන් බැහැරව සිටීමට හිමිකම් ඇති දින ගණන තීරණය කිරීමේ කාර්යය සඳහා ඒ ප්‍රසූතිය සිදුවූ දිනය වන විට ඇයට සිටි දරුවන් සංඛ්‍යාව නියමිතව දැනුම් දිය යුතුය. තවද,

(3) (1) වන උප වගන්තිය යටතේ හෝ (2) වන උප වගන්තිය යටතේ හෝ දැනුම් දෙන කම්කරු ස්ත්‍රියකට ඇය වෙනුවෙන් ප්‍රසූතිකාධාර ගෙවිය හැකි වෙනත් අයෙකු එම දැන්වීමෙහි නම් කළ හැකිය. තවද එසේ නම් කරන ලද අයෙකුට ගෙවන ලද ප්‍රසූතිකාධාරයන් වෙතොත් මෙම පනතෙහි කාර්යයන් සඳහා ඒ ගෙවීම එම අය නම් කළ කම්කරු ස්ත්‍රියට කරන ලද ගෙවීමක් හැටියට සලකනු ලැබේ.

(4) (1) වන උප වගන්තිය යටතේ හෝ (2) වන උප වගන්තිය යටතේ දැනුම් දීමක් ගැහැණු කම්කරුවෙකුගෙන් ලැබුණු විට සේවා යෝජක විසින් ඒ ගැහැණු කම්කරුවාට, 1985 අංක 43

(අ) ප්‍රසූතියෙන් සජීවී දරුවෙකු බිහි වුවහොත් සහ ප්‍රසූති දිනය වන විට ඇයට දරුවෙකු නොමැති නම් හෝ එක් දරුවෙකු පමණක් සිටී නම් ප්‍රසූතියට පෙරාතුවම සති දෙකක් සහ ප්‍රසූතියෙන් ඉක්බිතියෙන් සති දහයක් ද,

(ආ) (1) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි වුවහොත් සහ ඒ ස්ත්‍රියට ඒ ප්‍රසූත දින වන විට දරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටීනම්, හෝ,

(11) ප්‍රසූතියෙන් සජීවී දරුවෙකු බිහි නොවුවහොත් ප්‍රසූතියට පෙරාතුවම සති දෙකක් සහ ප්‍රසූතියෙන් ඉක්බිතිව සති හතරක් ද ඇයගේ සේවා නියුක්තියෙන් බැහැරව සිටීමට අවසර දිය යුතුය.

එසේ වුවද එවැනි ගැහැණු කම්කරුවෙකු (අ) ඡේදයේ සහ (ආ) ඡේදයේ සඳහන් ඉහතකී සති දෙකේ කාලසීමාව ඇතුළත ඇයගේ සේවා නියුක්තියෙහි යම්කිසි දින ගණනක් සේවය කර ඇති අවස්ථාවක ප්‍රසූතියෙන් පසුව අවස්ථාවෝචිත පරිදි ඉහත කී සති දහයේ හෝ සති හතරේ කකාලසීමාව අවසන් වීමෙන් ඉක්බිතිවම එළඹෙන දිනයෙන් ආරම්භව, ඒ දින ගණන ස්වකීය සේවා නියුක්තියෙන් බැහැරව සිටීමට අවසර දිය යුතුය.

(5) වන උප වගන්තිය ඉවත් කරන ලදී. 1981 අංක 52

8. ප්‍රසූත දිනත් ඇතුළුව ප්‍රසව කාලය දක්වා ගෙවිය යුතු සූතිකාධාර මුදල ප්‍රසූතිය ඔප්පු කිරීමට නියමිත සාක්ෂි ඉදිරිපත්කොට සතලිස් අට පැයක් ඇතුළතදී සේවා යෝජකයා විසින් කම්කරු ස්ත්‍රියට ගෙවිය යුතුය. ඊට පසු කාලය සඳහා ගෙවිය යුතු මුදල දෙවරකින් ඇයගේ ප්‍රසව කාලයෙන් පසු දෙවන සතිය අවසානයේදී ද හතරවන සතිය අවසානයේදී ද අනුපිළිවෙලින් ගෙවිය යුතුය.

ස්ත්‍රිය විසින් 7(2) වගන්තිය යටතේ සිය ප්‍රසූතිය පිළිබඳ තම සේවා යෝජකයාට දන්වා සිටිය ද දන්වා නොසිටිය ද මෙම වගන්තියේ විධිවිධාන එම සේවකයා කෙරෙහි බල පවත්නේය. 1962 අංක 24

9. මෙම පනතේ විධිවිධාන යටතේ සූතිකාධාර හිමි කම්කරු ස්ත්‍රියක් එම ප්‍රතිලාභ ලැබිය යුතු කාල සීමාවේ දී මරණයට පත් වී නම් එම සූතිකාධාර මුදල 7(3) යටතේ දැන්වීමෙහි නම් කල අයට හෝ එබඳු කෙනෙකු නැති විටෙක ඇයගේ නීත්‍යානුකූල උරුමක්කාරයින්ට හෝ ගෙවිය යුතුය. ස්ත්‍රියකට හිමි සූතිකාධාර ඇගේ මරණයෙන් පසු ගෙවීම

10. මෙම පනතෙහි විධිවිධාන ප්‍රකාර කම්කරු ස්ත්‍රියක් සේවයට නොපැමිණි විට එසේ නොපැමිණි කාලය තුල හෝ දැන්වීම අවසන් වන දිනය එබඳු නොපැමිණී සිටින දිනයක වන ලෙස හෝ ඇගේ සේවා යෝජකයා විසින් අස් කිරීමේ දැන්වීමක් දීම නීත්‍යානුකූල නොවන්නේය. සේවයට නොපැමිණීමට අවසරය ලැබී සිටියදී නොපැමිණීම සඳහා අස්කිරීමේම් ඈන්වීමක්

(අ) (1) ගැබ් ගැනීමේ හෝ ප්‍රසව අවස්ථාවේ හේතුවෙන් පමණක් නැතහොත් ගැබ් ගැනීමේ හෝ ප්‍රසව අවස්ථාවේ ප්‍රතිඵලයක් වශයෙන් සැදෙන යම් අසනීපයක් හේතුවෙන් පමණක් කම්කරු ස්ත්‍රියකගේ සේවය අවසන් නොකළ යුතුය.

(2) (1) වන උප වගන්තියේ විධිවිධාන කඩ කිරීමේ වරදට සේවා යෝජකයෙකුට විරුද්ධව නඩු පවරනු ලැබූ අවස්ථාවක ගැබ් ගැනීම හෝ ප්‍රසූතය හෝ ගැබ් ගැනීමේ හෝ ප්‍රසූතයේ ප්‍රතිඵලයක් වශයෙන් වූ අසනීපයක් යන හේතුව හැර වෙනයම් කරුණක හේතුවකින් කම්කරු ස්ත්‍රියකගේ සේවය අවසන් කරන ලදැයි ඔප්පු කිරීමේ භාරය සේවා යෝජකයා වෙත පැවරේ.

(ආ) (1) දැන්වීමේ නියමිත දිනයේ සිට එසේ නියම කරනු ලැබිය හැකි අන්දමේ (තුන් මසකට වැඩි නොවන) කාල සීමාවක් තුල ප්‍රසව අවස්ථාවට එළඹීමට තමා බලාපොරොත්තු වන බව තම සේවා යෝජකයා වෙත කම්කරු ස්ත්‍රියක විසින් දන්වා සිටිනු ලබන අවස්ථාවකදී ඒ දිනයෙහි ආරම්භව ඇයගේ ප්‍රසව අවස්ථාව සිදුවන දිනයට පෙරාතුවම දිනයෙන් කෙලවර වන කාල සීමාව තුල ඇයට හෝ ළදරුවාට අනර්ථදායක විය හැකි අන්දමේ වැඩක ඇය යෙදවිය යුතු නොවේ. නැතහොත් එසේ යොදවනු ලැබීමට කටයුතු නොසැලැස්විය යුතුය. නැතහොත් ඒ සඳහා අවසර නොලැබිය යුතුය. ගැබ් ගත් කාලය තුල හා ප්‍රසූතයෙන් පසුව තහනම් වූ වැඩ 1958 අංක 6

(2) ප්‍රසව අවස්ථාවට එළඹ සිටින කම්කරු ස්ත්‍රියක ඇය ප්‍රසව අවස්ථාවට එළඹුන දිනයෙන් ආරම්භ වන තුන් මාසයක කාලසීමාව ඇතුළත (1) වන උප වගන්තියේ සඳහන් කිසිම වැඩක නොයෙදවිය යුතුය. නැතහොත් ඒ සඳහා ඇයට අවසර නොලැබිය යුතුය.

11. (1) කම්කරු ස්ත්‍රියක ප්‍රසව කාලයට ඉහත පස් මසක කාලය අතරතුරදී සැහෙන කරුණු නොමැතිව සේවා යෝජකයකු විසින් ඇයට දෙන ලද අස්කිරීමේ දැන්වීමකින් එම දැන්වීම නුදුන්නේ නම් ඇයගේ ප්‍රසව අවස්ථාව වූ දිනයෙහි හෝ ඇයට මෙම පනත යටතේ හිමි නැතහොත් හිමි වන ප්‍රසූතිකාධාර හෝ විකල්ප ප්‍රසූතිකාධාර ලැබීම වැළැක්විය හැකි නොවන්නේය. විග්‍රහක අවස්ථාවන්හිදී අස්කිරීමේ දැන්වීමකින් සූතිකාධාර ලබාගැනීමේ බලයට හානියක් නොවන බව

35. 1946 අංක 53

(2) (1) වන උපවගන්තිය යටතේ දෙන ලද අස්කිරීමේ දැන්වීමකින් සෑහෙන කරුණු ඇතිව හෝ නැතිව දෙන ලද්දේ ද යන්න පිළිබඳව ප්‍රශ්නයක් පැන නැගුන විට එය කොමසාරිස්තුමා වෙත යැවිය යුතුය. ඒ පිළිබඳව ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය.

12. සේවා යෝජකයකු විසින් යම් කර්මාන්තයක සේවයෙහි නියුක්ත කරනු ලැබූ ගැහැණු කම්කරුවෙකුට සූතිකාධාර වශයෙන් යම් මුදලක් ගෙවීමට සේවා යෝජකයාගේ ඇති බැඳීම ඒ කර්මාන්තයේ වත්කම් මත පළමු වැය බරක් විය යුතුය.

12 (අ) (1) යම් කර්මාන්තයක ගැහැණු කම්කරුවන් නියමිත සංඛ්‍යාවකට වැඩි සංඛ්‍යාවක් සේවයෙහි නියුක්ත කරන සේවා යෝජකයකු විසින් වයස අවුරුදු පහට අඩු දරුවන් සඳහා දාරකාගාරයක් ඒ වෙනුවෙන් සාදන ලද නියෝග අනුව, පිහිටුවා පවත්වා ගෙන යා යුතු අතර, වයස අවුරුදු පහට අඩු දරුවෙකු හෝ දරුවන් තම භාරයේ ඇති එවැනි යම් කම්කරුවෙකුට ඇගේ සේවා යෝජක සඳහා වැඩ කිරීමට ඇයට නියම කරනු ලැබූ වේලාවන් තුල ඒ දරුවා හෝ දරුවන් ඒ දාරකාගාරයේ තබා යාමට ඉඩ දිය යුතුය.

සූතිකාධාර ගෙවීමට බැඳීම වත්කම් මත

1952 අංක 26
1958 අංක 6
1978 අංක 13

(2) යම් කර්මාන්තයක හෝ යම් කර්මාන්තයක ශාඛාවක සේවයෙහි නියුක්ත කරනු ලැබූ ගැහැණු කම්කරුවන් සංඛ්‍යාව සහ ඒ කර්මාන්තයෙහි හෝ ඒ ශාඛාවෙහි ගැහැණු කම්කරුවෙකුට ඉටු කිරීමට නියම කරනු ලබන වැඩ වල ස්වභාවය කෙරෙහි සැලකිල්ල ඇතිව කර්මාන්තයක් හෝ කර්මාන්තයේ ශාඛාවක් සඳහා සංඛ්‍යාවක් මේ වගන්තියේ කාර්යයන් ස ඳහා අමාත්‍යවරයා විසින් නියම කළ හැකිය .

(3) මෙම වගන්තිය යටතේ දාරක නිවාස වල මනා නඩත්තුව හා පරිපාලනය සඳහා ද සාමාන්‍යයෙන් ඒවායෙහි රඳවා ඇති ළමයින්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සහ ළමුන්ගේ ආරක්ෂාව නිසි පරිදි ඇත්දැයි දැන ගැනීම සඳහා ද අවශ්‍ය විධිවිධාන පැනවිය හැකිය. 1962 අංක 24

(4) (3) වෙනි උප වගන්තියෙන් සාමාන්‍ය වශයෙන් පවරා ඇති බලතල වලට හානියක් නොවන පරිදි මෙම වගන්තිය මගින් පනවා ඇති විධිවිධානයන් යටතේ පිහිටුවා ඇති දාරකාගාරයක් සම්බන්ධයෙන් පහත සඳහන් කොන්දේසි ඇතුළුව අනෙකුත් අදාළ කොන්දේසි පිළිබඳව රෙගුලාසි පැනවිය හැකිය. 1962 අංක 24

(අ) මෙවැනි දාරක නිවාස වල පිහිටීම සංයුතිය නඩත්තුව සහ පිරිසිදු කම .

(ආ) එවැනි දාරකාගාරයන්හි වාට්ටු හෝ කාමරවල ප්‍රමාණය සහ ඒවායෙහි එක් ළමයෙකු සඳහා වෙන් කරන බිම් ප්‍රමාණය.

(ඇ) එවැනි දාරකාගාර ප්‍රයෝජනයට ගන්නා අයට ප්‍රමාණවත් සේදීමේ පහසුකම්, වැසිකිළි පහසුකම් සහ අනෙකුත් පහසුකම් සැපයීම.

(ඈ) එවැනි දාරකාගාරයන්හි උපකරණ සහ සේවක පිරිස.

12 (ආ) යම් කර්මාන්තයක ගැහැණු කම්කරුවෙකු වයස එක් අවුරුද්දකට අඩු දරුවෙකුට මව්කිරි දෙන්නේ නම් පැය නමයක කාලයකදී ඇයට අවශ්‍ය පරිදි යම් වේලාවන්හිදී මව් කිරි දීමේ විවේක කාල දෙකක් සඳහා සේවා යෝජක විසින් ඉඩ දිය යුතුය. ඒ දරුවාට කිරි දීම සඳහා ඒ කම්කරුවාට ඒ සේවා යෝජක විසින් දාරකාගාරයක් හෝ වෙනත් සුදුසු ස්ථානයක් එසේ සලසා නොමැති අවස්ථාවක එක් එක් විවේක කාලය එක් පැයකට නොඅඩු විය යුතුය . තවද, එය යම් ලිඛිත නීතියක් යටතේ එම කම්කරුවාට ආහාර හෝ විවේකය ස ඳහා සලසන ලද යම්

මව්කිරි දෙන මව්වරු සඳහා විවේක කාල සැපයීම

1962 අංක 24

1978 අංක 13

විවේක කාලයකට අතිරේකව විය යුතු අතර ඇගේ සේවා නියුක්තියේ ඇය වැඩ කළ කාලය වශයෙන් සලකනු ලැබිය යුතුය.

13.(1) කම්කරු කොමසාරිස් හෝ වෙනත් විශේෂ නිලධාරියෙක් හෝ මෙම ආඥා පනතේ කාර්යයක් සඳහා ඕනෑම විටෙක තමාට අවශ්‍ය යැයි හැඟෙන විස්තර ඇතුළත් වාර්තාවක් හෝ යම් රෙගුලාසියක් මගින් ගැහැණු කම්කරුවන් වෙනුවෙන් නඩත්තු කිරීමට නියම කර ඇති ලේඛනයක් හෝ එහි කොටසක් නියම කරන ලද දිනයට පෙර තමා වෙත ඉදිරිපත් කරන ලෙස යම් සේවා යෝජකයකු වෙත දැන්වීමක් මගින් සැලකර සිටිය හැකිකිය . එය නියම කර සිටි විට එවැනි වාර්තාවක් නියමිත දිනයට පෙර කොමසාරිස් වෙත හෝ එකී විශේෂ නිලධාරියා වෙත සැපයීම සේවා යෝජකයාගේ යුතුකම වන්නේය. 1962 අංක 24

(2) (1) වන උපවගන්තිය යටතේ වූ කොමසාරිස් තැනගේ දැන්වීමක් මත එම දැන්වීම අදාළ වූ සේවා යෝජකයාට නිසි පරිදි දැන්වූ ලෙස සලකනු ලබන්නේ පහත දැක්වෙන යමක් කළ විටය.

(අ) ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කිරීම හෝ,

(ආ) සේවා යෝජකයාගේ පුරුදු වැඩ කටයුතු කරන ස්ථානයට හෝ පදිංචි ස්ථානයට ලියුමක් තැපැලෙන් යැවීම ද වේ.

14. (1) කොමසාරිස් වරයාට හෝ යම් විශේෂ නිලධාරියෙකුට, පරීක්ෂා කිරීමේ බලය

(අ) මේ ආඥාපනතේ විධිවිධාන පිළිපදිනු ලබන්නේදැයි නිශ්චය කිරීමේ කාර්යය සඳහා යම් කර්මාන්තයක ගැහැණු කම්කරුවන් සේවයෙහි නියුක්ත කරනු ලබන යම් ස්ථානයකට හෝ තැනකට දහවල් හෝ රාත්‍රියේ සියළු සාධාරණ වේලාවන් හිදී ඇතුළු වීමට සහ පරීක්ෂා කිරීමට. 1946 අංක 35, 1958 අංක 6, 1962 අංක 24, 1978 අංක 13

(ආ) යම් නියෝගයක් මගින් එම කම්කරුවන්ගේ සේවායෝජක විසින් පවත්වාගෙන යාමට නියම කරනු ලැබූ ගැහැණු කම්කරුවන් පිළිබ ඳ යම් ලේඛනයක් පරීක්ෂා කිරීමට.

(ඇ) ඒ තැන හෝ ඒ ස්ථානය පරීක්ෂා කරනු ලබන වේලාවේදී එකී යම් ලේඛනයක් පරීක්ෂා කිරීම සඳහා ලබා ගත නොහැකි අවස්ථාවක තම කාර්යාලයේදී හෝ ඒ තැන හෝ ඒ ස්ථානයේදී ඒ ලේඛනය ඉදිරිපත් කිරීමට සහ,

(ඈ) ඒ තැන හෝ ඒ ස්ථානයෙහි ඔහුට දක්නට ලැබෙන සහ එහි කර ගෙන යනු ලබන කර්මාන්තයක ගැහැණු කම්කරුවන් සේවයෙහි නියුක්ත කරනු ලබන සේවා යෝජකයෙකු යයි හෝ එහි සේවයෙහි නියුක්ත කම්කරුවෙකු යැයි විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු ඇති යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමට බලය තිබිය යුතුය.

(1 අ) යම් තැනක හෝ ස්ථානයක පරීක්ෂණයක් පවත්වන අතරතුර මේ ආඥාපනතේ විධිවිධාන පිළිපදිනු ලැබුවේ දැයි විනිශ්වය කිරිමේ කාර්ය ස ඳහා ඒ තැන හෝ ඒ ස්ථානයේ කරගෙන යනු ලබන යම් කර්මාන්තයක ගැහැණු කම්කරුවන් සේවයෙහි නියුක්ත කරනු ලබන සේවා යෝජකගෙන් විමසීම් කිරීමේදී කොමසාරිස් වරයා හෝ විශේෂ නිලධාරියකු විසින් නියම කරන ලද තොරතුරු සැපයීමට ඒ සේවා යෝජකගේ යුතුකම විය යුතුය.

15. (1) මෙම ආඥා පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන පවත්වාගෙන යෑම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා හෝ මෙම ආඥාපනත යටතේ රෙගුලාසි පැනවීම අවශ්‍ය කරන හෝ පනවන ලෙස බලය ලැබී ඇති හෝ කරුණු සම්බන්ධයෙන් ඇමතිවරයා විසින් රෙගුලාසි පැනවිය හැකිය. නියෝග

(2) විශේෂයෙන්ම මෙහි (1) වෙනි උප වගන්තිය සාමාන්‍ය වශයෙන්ද දක්වා ඇති බලතල වලට හානියක් නොවන පරිදි පහත සඳහන් කරුණු සියල්ලම හෝ කිසිවක් විෂයෙහි හෝ ඒවා සම්බන්ධයෙන් හෝ ඇමතිවරයා විසින් රෙගුලාසි පැනවිය හැකිය.

(අ) නියම කිරීමට වුවමනා හෝ නියම කළයුතු යයි මෙම ආඥා පනතේ සඳහන් වන ඕනෑම කරුණක්,

(ආ) කාන්තා සේවකයන්ගේ නම් ලැයිස්තු සකස් කිරීම , ඒවා පවත්වාගෙන යාම, පරීක්ෂා කිරීම හා එම ලැයිස්තු වල සඳහන් විය යුතු කරුණු පරීක්ෂා කිරීම.

(ඇ) යම් කර්මාන්තයක ගැහැණු කම්කරුවන් සේවයෙහි නියුක්ත කරනු ලබන ස්ථාන හෝ තැන් පරීක්ෂා කිරීම.

(ඈ) ආඥා පනත යටතේ කළ යුතු දැන්වීම් සහ ඒවා භාරදීම , දැන්වීම් පුවරු සහ දැන්වීම් පොත් පවත්වාගෙන යාමට අදාල කරුණු.

(ඉ) මෙම ආඥාපනතින් විධිවිධාන සලසා නැති ප්‍රසූතිකාධාර ගෙවන ක්‍රමය.

(ඊ) පස් වන වගන්තියේ තුන් වන උප වගන්තියෙහි නිදහස් කිරීම සඳහා නියම කිරීමට වුවමනා වූ විකල්ප ප්‍රසූතිකාධාර.

(උ) මෙම පනත යටතේ වූ විශේෂ නිලධාරියෙකුගේ යුතුකම් හා බලතල.

(ඌ) ඉහතින් කී කරුණු වලට අදාළ වූ නැතහොත් සම්බන්ධ වූ වෙනත් කරුණු ද වේ.

(3) කිසිම නියෝගයක් උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන තුරු වලංගු නොවන්නේය. එම අනුමැතිය පිළිබඳ නිවේදනය “ ගැසට් ” පත්‍රයෙහි පල කරවිය යුතුය.

(4) සෑම නියෝගයක්ම (3) වෙනි උප වගන්තිය යටතේ එම නියෝගයෙහි අනුමැතිය පිළිබඳ නිවේදනය ප්‍රසිද්ධ කළ විට මෙහි පනවන ලද්දක් සේම ක්‍රියාකාරීව බලපවත්වන්නේය.

16. (1) සේවා යෝජකයෙකුව සිටියදී යම් තැනැත්තකු,

(අ) මෙම ආඥා පනතේ හෝ ඒ යටතේ පනවනු ලැබූ යම් නියෝගයක යම් විධිවිධානයක් කඩ කරමින් හෝ ඊට අනුකූලව ක්‍රියාා කිරීම පැහැර හරිමින් ක්‍රියා කළහොත් හෝ ,
(ආ) මේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ පනවනු ලැබූ යම් නියෝගයක් යටතේ උවමනා කරනු ලබන්නාවූද, තමා විසින්

සපයනු ලබන්නාවූ හෝ සපයනු ලැබීමට තමා විසින් කටයුතු සලස්වනු ලබන්නාවූද, යම් වාර්තාවක හෝ ප්‍රවෘත්තියක අසත්‍යය යැයි තමා දන්නා යම් ප්‍රකාශයක් කළහොත් හෝ කරනු ලැබීමට කටයුතු සැලැස්වුවහොත් හෝ,

(ඇ) මේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ පනවනු ලැබූ යම් නියෝගයක් යටතේ තබනු ලබන යම් වාර්තාවක ලේඛනයක හෝ පොතක අසත්‍ය යයි තමා දන්නා යම් සටහනක් කළහොත් හෝ කරනු ලැබීමට කටයුතු සැලැස්වුවහොත් හෝ,

(ඈ) මේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ පනවනු ලැබූ යම් නියෝගයක් යටතේ ඒ නිලධාරියා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ බලතල හෝ යුතුකම් පාවිච්චි කිරීමේදී හෝ ඉෂ්ඨ කිරීමේදී යම් නිලධාරියෙකුට බාධා කළහොත් අවහිර කළහොත් හෝ හිංසා කළහොත් ඔහු මේ ආඥා පනත යටතේ වරදකට වැරදි කරුවෙකු විය යුතුය . තවද මහේස්ත්‍රාත් වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරද කරුවී රුපියල් පන්සියයකට වැඩි නොවන දඩයකටද යටත් විය යුතුය. අවහිර කළහොත් හෝ හිංසා කළහොත්

(2) මේ ආඥා පනතේ විධිවිධාන අනුව යම් කම්කරු ස්ත්‍රියකට ප්‍රසූතිකාධාර ගෙවීම පැහැර හැරීමේ වරදට යම් සේවා යෝජකයකු වරදකරු වූ විට ඒ කම්කරු ස්ත්‍රියට ප්‍රසූතිකාධාර වශයෙන් ලැබිය යුතු යයි උසාවිය විසින් සලකනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් ගෙවන ලෙස අන් කිසි දණ්ඩන නියමයකට අතිරේක වශයෙන් උසාවිය විසින් සේවා යෝජකයාට අණ කළ හැකිය . මේ උප වගන්තිය යටතේ ගෙවන ලෙස අණ කරනු ලබන යම් මුදලක් දඩ මුදලක ආකාරයෙන්ම අය කර ගත හැකිය.

17. මෙම පනතට හෝ එය යටතේ පනවන ලද නියෝගයකට හෝ විරුද්ධව කරන ලද වරදකට කොමසාරිස් තැන විසින් හෝ ඔහුගේ අනුමැතිය ලියවිල්ලකින් ලබාගෙන හෝ හැර කිසිම නඩුවක් නොපැවරිය යුතුය. කොමසාරිස්තුමාගේ අනුමැතිය නොමැතිව නඩු නොපැවරිය යුතු බව

18. වරද කරනු ලැබුවේ යම් දිනයකද ඒ දිනයේ සිට අවුරුදු හයක් ඇතුළත ඒ සම්බන්ධයෙන් පැමිණිලි කරනු ලැබුවේ නම් මිස මේ ආඥා පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ යම් වරදක් කිසිම අධිකරණයක් විසින් සංජානනය කිරීමට හෝ එවැනි වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරද කරු කරනු ලැබීම හෝ නොකළ යුතුය. ඉහත කී අවුරුදු හයක කාලය ආගණනය කිරීමේදී කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගැනීමේ කාර්යය සඳහා ගන්නා ලද කාලයක් ඇතොත් එය අත්හරිනු ලැබිය යුතුය. වරද කරනු ලැබූ දින සිට අවුරුදු හයක් ඇතුළත නඩු පවරනු ලැබිය යුතු බව.

1946 අංක 35
1978 අංක 13

19. මෙම ආඥා පනත යටතේ යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු ප්‍රසූතිකාධාර අහෝසි වන ලෙසින් හෝ අඩු කරන ලෙසින් හෝ කාන්තා සේවිකාවනට ප්‍රසූතිකාධාර ලැබීමේ අයිතිය අහිමි කරන ලෙස හෝ ඒ ආකාරයට 1941 ජුලි 28 දිනට පෙර හෝ පසුව හෝ ගිවිසුමක් හෝ කොන්ත්‍රාත්තුවක් ඇත්නම් එය අහෝසි වන්නේය . ගිවිසුමකින් නොබැඳීම 1946 අංක 45

20. මෙම පනතෙහි විධිවිධාන ස්ත්‍රීන්ගේ හෝ කම්කරු ස්ත්‍රීන්ගේ සේවය හෝ වැටුප් හෝ එබඳු සේවයක නියම හො ඒ සම්බන්ධයෙන් වෙනත් ලිපිගත නීතියක විධිවිධාන වල බලය අඩු කිරීම් වශයෙන් නොව ඒවාට අතිරේකව වන්නේය. වෙනත් නීති අඩාළ කිරීම

21. මෙම පනතෙහි පද යෙදුමෙන් වෙනත් අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස පහත දැක්වෙන පාඨයන්හි අර්ථය මෙහි පෙනෙන පරිදි වන්නේය . “ කොමසාරිස් ”

කොමසාරිස් යන්නෙන් එවකට කම්කරු කොමසාරිස් ධූරය දරන තැනැත්තකු අදහස් කරයි. තවද එසේම එවකට නියෝජ්‍ය කම්කරු කොමසාරිස් ධූරය දරන තැනැත්තෙකු ද ඇතුලත්ය. " ප්‍රසව අවස්ථාව " ප්‍රසව අවස්ථාව යන්නෙන් පන ඇති හෝ පන ගිය ළමයෙකු බිහිවීමෙන් හෝ ජීවත් විය හැකි කලල රූපයක් බිහිවීමෙන් කෙළවර වන ප්‍රසව වේදනාව අදහස් වෙයි. තවද " ප්‍රසව අවස්ථාවට එළඹුනු " යන පාඨයේ අර්ථය එපරිද්දෙන්ම නිරූපනය කළ යුතුය. අර්ථ නිරූපනය

(අ) " සේවා යෝජක " යන්නෙන් යම් ගැහැණු කම්කරුවෙකු තමා වෙනුවෙන් සේවයෙහි නියුක්ත කරනු ලබන යම් තැනැත්තෙකු හෝ ඒ තැනැත්තා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන්නේද ඒ තැනැත්තා හෝ අදහස් වන අතර යම් වෙනත් තැනැත්තකු වෙනුවෙන් යම් තැනැත්තකු විසින් ගැහැණු කම්කරුවෙකු සේවයෙහි නියුක්ත කරනු ලබන්නේ ද ඒ තැනැත්තා ද ඇතුළත් වේ. 1958 අංක 6 1978 අංක 13

(ආ) " සේවා නියුක්තිය " යන්නෙහි ව්‍යාකරණානුකූල වෙනස් වීම් සහ සජාතීය යෙදුම් සමග ගැහැණියක් හෝ ගැහැණු කම්කරුවෙකු සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලැබූ විට යම් කර්මාන්තයක සේවා නියුක්තිය අදහස් වේ. 8, 6, 1958 9. 13. 1978

(ඇ) " කාර්යාලය " යන්නට සාප්පු හා කාර්යාල සේවකයන් පිළිබද ( සේවා නියුක්තිය සහ පාරිශ්‍රමික විධිමත් කිරීමේ ) පනතේ දී ඇති අර්ථයම ඇත්තේය.
(ඈ) " නියමිත " නියමිත යන්නෙන් මෙම පනතින් හෝ නියෝගයකින් නියම කරන ලද්දක් හඟවයි.
(ඉ) " නියෝගය " නියෝග යනුවෙන් මෙම පනත යටතේ ඇමතිවරයා විසින් සාදන ලද නියෝගයක් අදහස් කරයි. 1978 අංක 13

" සාප්පුව " යන්නෙහි සාප්පු හා කාර්යාල සේවක (සේවා නියුක්තිය සහ පාරිශ්‍රමික විධිමත් කිරීමේ ) පනතේ එයට දී ඇති අර්ථයම ඇත්තේය. 1946 අංක 35 1958 අංක 17

(ඊ) " විශේෂ නිලධාරියා" යනුවෙන් හඳුන්වන්නේ නියෝජ්‍ය කම්කරු කොමසාරිස්, සහකාර කම්කරු කොමසාරිස් කෙනෙක් හෝ දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරීවරයෙක් මෙම පනතෙහි විධිවිධාන ක්‍රියාවෙහි යෙදවීම සඳහා කොමසාරිස් විසින් ලිඛිතව පත්කරනු ලබන වෙනත් කෙනෙකු හෝ වෙයි. 1978 අංක 13

" කර්මාන්තය " යන්නට සේවායෝජකයකු විසින් කම්කරුවෙකු විසින් හෝ කර ගෙන යනු ලබන , ඉටුකරනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් කාර්මික ව්‍යාපාරයක්, වෙළඳ ව්‍යාපාරයක්, ව්‍යාපාරයක්, ව්‍යාපෘතියක්, වෘත්තියක් හෝ ජීවනෝපායක් සහ යම් කර්මාන්තයක යම් ශාඛාවක් හෝ යම් කාර්යයක් හෝ කාර්යවලියක් ඇතුළත් වන්නේය.

එහෙත් බාලාපරාධකරුවන්ට හෝ අනාථයන්ට හෝ අසරණ ගොලු, බිහිරි හෝ අන්ධ තැනැත්තන්ට කාර්මික පුහුණුවක් දීමේ කාර්යය සඳහා ප්‍රධාන වශයෙන් ම පවත්වාගෙන යනු ලබන යම් කාර්මික ව්‍යාපාරයක්, වෙළඳ ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරයක් එයට ඇතුළත් නොවේ. වෙනත් නීති අභාඃ කිරීම

"සාධ්‍ය කළල රූපයක් " යනුවෙන් අදහස් කරනුයේ යටත් පිරිසෙයින් සතිති 28 ක් වයසැති කළල රූපයකි. සැකයක් ඇතිවූ විටදී කළල රූපයකට සති 28 ක් වයස ඇත්තේ යයි සැලකීමට පහත දැක්වෙන කරුණු වලින් එකක් සම්පූර්ණ විය යුතුය.

අ. කළල රූපයේ දිග යටත් පිරිසෙයින් අගල් 12 ක් විය යුතුය.
ආ. කළල රූපයේ බර යටත් පිරිසෙයින් රාත්තල් 2 ක් වත් විය යුතුය.

(උ) “ ගැහැණු කම්කරුවා ” යන්නෙන් වේතන කාලය අනුව හෝ කරන ලද වැඩ අනුව හෝ අන්‍ය ආකාරයකට හෝ ගණන් බලනු ලැබුවද ඒ වේතන මත සේවා නියුක්ති හෝ සේවා ගිවිසුම මේ ආඥා පනත ආරම්භ වීමට පෙර හෝ පසුව කරන ලද්දේ වුවද එම ගිවිසුම ප්‍රකාශිතව හෝ ගම්‍යමානකව , වාචිකව හෝ ලිඛිතව වුවද යම් කර්මාන්තයක සේවයෙහි නියුක්ත කරන ලද ( සාප්පුවක හෝ කාර්යාලයක, වෙළඳ ව්‍යාපාරයේ හෝ වෙළඳ ව්‍යාපාරය පිළිබඳව සේවයෙහි නියුක්ත ගැහැණියක් හෝ අනියම් ස්වභාවයක සේවයෙහි නියුක්ත ගැහැණියක් හැර ) ගැහැණියක් අදහස් වේ. ” 1978 අංක 13

## නියෝග

1.පනතෙහි 5 වෙනි වගන්තියෙහි සඳහන් කරන ලද ප්‍රසූතිකාධාර ගෙවිය යුතු ක්‍රමය නම් එක් දිනකට රුපියල බැගිනි.

2.පනතෙහි 5 වෙනි වගන්තියෙහි (3) වෙනි උප වගන්තියෙහි කාර්යයන් සඳහා තමන්ගේ වත්තෙහි කම්කරු ස්ත්‍රීන් හට සේවා යෝජකයෙකු විසින් සැපයිය යුතු අන්‍ය ප්‍රසූතිකාධාර මෙහි පහත දැක්වෙන පරිදි විය යුතුය :-

(අ) කොමසාරිස් තැන විසින් අනුමත කරන ලද මව්වරුන්ගේ වාට්ටුවක් හෝ සූතික වාට්ටුවක් දහ දවසකට අඩු නො වන කාලයකට ප්‍රසව කාලය සඳහා ප්‍රයෝජන ගැනීම,

(ආ) ප්‍රසව අවස්ථාවෙහිදී වින්නඹුවකගේ සේවය,

(ඉ) මව්වරුන්ගේ වාට්ටුවෙහි හෝ සූතික වාට්ටුවෙහි සිටින කාලය තුළ කම්කරු ස්ත්‍රියට ආහාර, සහ

(ඊ) (i) කම්කරු ස්ත්‍රියකගේ ප්‍රසව කාලයට කලින් ම වූ සති දෙකක කාලය තුළ සතියකට රුපියල් හතර බැගින් හෝ එම කාලය තුළ ඇය විසින් වැඩ කර තිබේ නම් වැඩ කරන ලද අන්තිම දිනයට පසුව පැමිණෙන දිනය තෙක් කාලයට දිනකට රුපියලකින් හතෙන් හතර බැගින් ද,

(ii) ප්‍රසව කාලය පසුව වූ සති හතරක කාලයට එම කම්කරු ස්ත්‍රියට සතියකට රුපියල් හතර බැගින් ද මුදලෙන් ගෙවීම ද වේ.

3.පනතෙහි 5 වෙනි වගන්තියෙහි (3) වෙනි උප වගන්තිය යටතේ හෝ 6 වෙනි වගන්තියෙහි (1) වෙනි හෝ (2) වෙනි උප වගන්ති යටතේ හෝ කම්කරු ස්ත්‍රියක විසින් තම සේවායෝජකයාහට දෙන දැන්වීම කටවචනයෙන් හෝ ලියවිල්ලකින් හෝ කළ හැකි ය.

4.(1) පනතෙහි 5 වෙනි වගන්තියෙහි (3) වෙනි උප වගන්තියෙහි හෝ 6 වෙනි වගන්තියෙහි (1) වෙනි හෝ (2) වෙනි උප වගන්ති යටතේ හෝ කම්කරු ස්ත්‍රියක විසින් තම සේවායෝජකයාහට කට වචනයෙන් ප්‍රකාශයක් කිරීමෙන් සහ දැන්වීම් පොතෙහි ඒ සඳහා වෙන්කොට ඇති ස්ථානයෙහි අත්සන් කිරීමෙන් හෝ තමන්ගේ ඇඟිලි සලකුණ තැබීමෙන් ම හෝ දිය යුතුය.

(2) කම්කරු ස්ත්‍රියක විසින් තම සේවායෝජකයා හට --

(අ) 5 වෙනි වගන්තියෙහි (3) වෙනි උප වගන්තිය යටතේ ලබා දිය යුතු දැන්වීම් උපලේඛනයේ දැක්වෙන “ අ ” ආකෘතියේ ආකාරයට ද,

(ආ) 6 වෙනි වගන්තියෙහි (2) වෙනි උප වගන්තිය යටතේ ලියා දිය යුතු දැන්වීම උපලේඛනයෙහි දැක්වෙන “ ආ ” ආකෘතියේ ආකාරයට ද,

(ඉ) 6 වෙනි වගන්තියෙහි (2) වෙනි උප වගන්තිය යටතේ ලියා දිය යුතු දැන්වීම උපලේඛනයෙහි දැක්වෙන “ ඉ ” ආකෘතියේ ආකාරයට ද,

විය යුතුය.

(3) (2) වෙනි ඡේදයෙහි සඳහන් වූ ලියා දිය යුතු සෑම දැන්වීමක්ම --

(අ)සේවා යෝජකයා පදිංචි ස්ථානයට හෝ ව්‍යාපාරික ස්ථානයට හෝ දැන්වීම භාර දීමෙන් ද නැතහොත්,

(ආ) සේවා යෝජකයා පදිංචි ස්ථානයට හෝ ව්‍යාපාරික ස්ථානයට හෝ දැන්වීම සාමාන්‍ය තැපෑලෙන් හෝ රිජිස්ටර් තැපෑලෙන් යැවීමෙන් ද.

දිය හැකිය.

5.පනතෙහි 7 වෙනි වගන්තියෙහි කාර්යයන් සඳහා පහත දැක්වෙන සහතික ප්‍රකාශයන්ගෙන් එකක් ප්‍රසව කාලය පිළිබඳ ව සෑහෙන සාක්ෂියක් වන්නේ ය:-

(අ) කම්කරු ස්ත්‍රියගේ ප්‍රසව අවස්ථාවේදී ප්‍රතිකාර කළ වෛද්‍යාචාර්යවරයාගේ සහතික ප්‍රකාශයක්,

(ආ) ප්‍රසවය සිදුවුනු සූතිකාගාරය, මාතෘ නිවාසය නැතහොත් වෙනත් එබඳු ආයතනයක් භාරව සිටි නිලධාරියාගේ සහතික ප්‍රකාශයක්,

(ඉ) කම්කරු ස්ත්‍රියගේ ප්‍රසව අවස්ථාවේදී ප්‍රතිකාර කළ වින්නඹුවගේ සහතික ප්‍රකාශයක්,

(ඊ) කම්කරු ස්ත්‍රියගේ ප්‍රසව අවස්ථාවෙහි පැමිණ සිටි, ප්‍රසවය සිදුවූ බවට සාක්ෂි දිය හැකි දෙදෙනෙකු විසින් අත්සන් කර දෙන ලද සහතික ප්‍රකාශයක්, හා

(උ) 94 වෙනි පරිච්ඡේදය වූ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ නිකුත් කරන ලද ළමයාගේ උත්පත්තිය සම්බන්ධයෙන් වූ සහතික ප්‍රකාශයක් ද වේ.

6. මෙම උපලේඛනයෙහි (ඊ) ආකෘතියට සාරානුකූලවූ, තමාගේ සේවයෙහි වූ කම්කරු ස්ත්‍රීන් පිළිබඳ ලේඛන පොතක්, සෑම සේවායෝජකයකු විසින් ම තැබිය යුතුය. එම ආකෘතියේ සටහන් කළ යුතු ලෙස ඉඩ හැර තිබෙන සෑම විස්තරයක් ම සුදුසු වේලාවලදී එහි ඇතුළත් කරවිය යුතුය.

7.මෙම උපලේඛනයෙහි දැක්වෙන (උ) ආකෘතියට සාරානුකූලවූ, දැන්වීම් පොතක්, සෑම සේවායෝජකයකු විසින් ම තැබිය යුතුය. තවද, එම ආකෘතියෙහි සටහන් කළ යුතු ලෙස ඉඩ හැර තිබෙන සෑම විස්තරයක් ම සුදුසු වේලාවලදී එහි ඇතුළත් කරවිය යුතුය.

8.තමන්ගේ සේවයෙහි සිටින කම්කරු ස්ත්‍රීන්ට වුවමනා විටක පාවිච්චි කිරීම සඳහා , මෙම උපලේඛනයෙහි දැක්වෙන අ , ආ සහ ඉ ආකෘති පත්‍ර සෑහෙන ප්‍රමාණයක් සෑම සේවායෝජකයෙකු විසින් ම සැපයිය යුතුය.

9.මෙම නියෝගයන්හි --

" දැන්වීම් පොත " යන්නෙන් අදහස් කරන්නේ 7 වෙනි නියෝගය යටතේ සේවායෝජකයෙකු විසින් තබන දැන්වීම් පොතක් ය.
" පනත " යනුවෙන් 1939 යේ අංක 32 දරන ප්‍රසූතිකාධාර පනත අදස් කරයි.

10.පනතෙහි 13 වෙනි වගන්තිය යටතේ සාදන ලදුව 1941 කේ සැප්තැම්බර් මස 12 වෙනි දින හා අංක 8,793 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග, මෙයින් අවලංගු කරනු ලැබේ.

**උපලේඛනය**
**" අ " ආකෘතිය**
**1939 යේ අංක 32 දරන ප්‍රසූතිකාධාර පනත**

............................................................ (නම) වන මම මෙම ආඥාපනතින් නියම කරන ලද අනාා ප්‍රසූතිකාධාර ලැබීමට කැමති බව මෙයින් දැනුම් දෙමි.

.........................................
දිනය :- ........................ සේවකයාගේ අත්සන හෝ ඇඟිලි සලකුණ

------------------------------------

**" ආ " ආකෘතිය**
**1939 යේ අංක 32 දරන ප්‍රසූතිකාධාර පනත**
**බලාපොරොත්තුවන ප්‍රසව කාලය**

....................................................... ( සේවායෝජකයාගේ නම) වෙතටයි.
.............................................................. (නම) වන මම අද දින සිට මාසයක් ඇතුළතදී ප්‍රසව අවස්ථාවට එළඹීමට බලාපොරොත්තු වන බව මෙයින් දන්වමි.

..........................................

දිනය :- ........................ සේවකයාගේ අත්සන හෝ ඇඟිලි සලකුණ

මට ගෙවිය යුතු ප්‍රසූතිකාධාර ලැබීමට .......................................... ( ලැබුම් කාරයාගේ නම මෙහි සඳහන් කරනු ) වන අය මෙයින් නම් කරමි.

..........................................

දිනය :- ........................ සේවකයාගේ අත්සන හෝ ඇඟිලි සලකුණ

------------------------------------

**“ ඉ ” ආකෘතිය**
**1939 යේ අංක 32 දරන ප්‍රසූතිකාධාර පනත**
**ප්‍රසව අවස්ථාව දැන්වීම**

....................................................... ( සේවායෝජකයාගේ නම) වෙතටයි.
.............................................................. (නම) වන මම ...................... දින (මෙහි දිනය සඳහන් කරනු ) දරුවෙකු ප්‍රසූත කළ බව මෙයින් දැනුම් දෙමි . එය තහවුරු කිරීම සඳහා නියමිත සහතික ප්‍රකාශයද ඉදිරිපත් කරමි.

..........................................

දිනය :- ........................ සේවකයාගේ අත්සන හෝ ඇඟිලි සලකුණ

මට ගෙවිය යුතු ප්‍රසූතිකාධාර ලැබීමට .......................................... ( ලැබුම් කාරයාගේ නම මෙහි සඳහන් කරනු ) වන අය මෙයින් නම් කරමි.

..........................................

දිනය :- ........................ සේවකයාගේ අත්සන හෝ ඇඟිලි සලකුණ

**“ ඊ ” ආකෘතිය**
කම්කරු ස්ත්‍රීන් පිළිබඳ ලේඛන පොත

| කම්කරු ස්ත්‍රියගේ සම්පූර්ණ නම | සේවය ආරම්භ වූ දිනය | සේවය ආරම්භයේදී කම්රු ස්ත්‍රියගේ අත්සන හා ඇඟිලි සලකුණ | සේවය අවසන් කළ දිනය | සේවය අවසානයේදී කම්රු ස්ත්‍රියගේ අත්සන හා ඇඟිලි සලකුණ |
|---|---|---|---|---|
| | | | | |

## “ උ ” ආකෘතිය
## දැන්වීම් පොත

| දැන්වම ලැබුනු දිනය | දැන්වීම පනතෙහි 5(3), 6(1) හෝ (2) යටතේ ලැබුනක්ක් ද ? | දැන්වීම දෙන කම්කරු ස්ත්‍රියගේගේ නම | දැන්වීම ලියන ලදද නැතහොහොත් කට වචනයෙන් ද? | කට වචනයෙන්න් දැනුම් දෙන කම්කරු ස්ත්‍රියගේ අත්සන හෝ ඇඟිලි සලකුණ | ස්ත්‍රිය වෙන්වෙන් ප්‍රසූතිකාධාර ගෙවිය යුතු අයෙක් නම් කොට ඇතොත් ඔහු | ප්‍රසව අවස්ථාවට පත්ත්වූ දිනය | ගෙවන ලද මුදල් ප්‍රමාණය සහ ගෙවූ දින* |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

* මේ තීරවල පහත දැක්වෙන පරිදි ගෙවීම් ගණන් දැක්විය යුතුය :-

(1) ප්‍රසව අවස්ථාවට පත් වූ දිනය ඇතුළුව එම දිනය දක්වා ඇති කාලයට ගෙවි ගණන.

(2) ප්‍රසව අවස්ථාවෙන් පසු දෙ වන සතිය අවසානයේදී ගෙවි ගණන.

(3) ප්‍රසව අවස්ථාවෙන් පසු සතර වන සතිය අවසානයේදී ගෙවි ගණන.